**ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය - 2019**

**-----------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාංශය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කාර්යාංශය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාංශයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස කාර්යාංශයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කාර්යාංශයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාංශයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කාර්යාංශය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම**

-----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිත 02 හි 25 හා 26 ඡේද ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේදී ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම සඳහා දරන ලද වියදම වූ රු.23,226,559 ක්, වාහන විකුණුම් ආදායම රු.4,371,000 ක් හා මූල්‍ය කල්බදු වටිනාකම රු.15,450,000 ක් වෙන් වෙන් වශයෙන් දක්වා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (ආ) | ප්‍රමිත 07 ප්‍රකාරව රු.3,082,050 ක් වූ පරිගණක මෘදුකාංග සඳහා ක්ෂය වෙන්කිරීම් කර නොතිබුණි. | 2013 වර්ෂය දක්වා ගිණුම්වලදී පරිගණක මෘදුකාංග 7.5% කින් ක්ෂය කර ඇත. එම ක්ෂය කිරීම් ක්‍රමවේදයෙන් වර්තමානයේ ඉවත් වී ඇත. | ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (ඇ) | ප්‍රමිත 19 හි 61 ඡේදය ප්‍රකාරව පාරිතෝෂිත වෙන් කිරීම් ගණනය කිරීමේදී ආයුගණක තක්සේරු ශිල්පක්‍රම භාවිතා කරමින් විශ්වාසදායී ඇස්තමේන්තුවක් සිදු කල යුතු වුවත්, ඊට අනුකූල නොවන ලෙස නිලධාරියා අවසන් වරට ලබාගත් වැටුප හා සේවා කාලය පමණක් පදනම් කර ගෙන රු.14,986,829ක් පාරිතෝෂිත වෙන් කිරීම සිදු කර තිබුණි. | ඉදිරියේදී ඒ අනුව කටයුතු කරනු ලැබේ. | ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයේදී මිලදී ගන්නා ලද පිරිවැය රු.6,600,000 ක් වූ වාහනයක් 2018 වර්ෂය වෙනුවෙන් ක්ෂය වෙන් කිරීමක් සිදුකර නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂය අවසානයට ක්ෂය වෙන් කිරීම රු.1,650,000 කින් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි. | විගණනය හා එකග වේ. | ක්ෂය වෙන් කිරීම් නිවැරදිව ගැලපිය යුතු බව. |
| (ආ) | ස්ථාවර වත්කම් විකිණීමේ ලාභය ගණනය කිරීමේදී ඒ සඳහා දරනු ලබන සියළු වියදම් සැලකිල්ලට ගත යුතු නමුත් සමාලෝචිත වර්ෂයේදී රු.4,471,000 කට විකුණන ලද වාහන 02 ක් සම්බන්ධයෙන් ලාභය ගණනය කිරීමේදී පුවත්පත් දැන්වීම් සඳහා දරන ලද වියදම වූ රු.408,529 ක් සැලකිල්ලට නොගෙන ලාභය ගිණුම් ගතකර තිබුණි. | විගණනය හා එකග වන අතර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ස්ථාවර වත්කම් විකිණීමේදී අදාළ සියලු වියදම් වත්කම් වටිනාකමට එකතු කළ යුතු බව. |
| (ඇ) | 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාර්යංශයේ ප්‍රධාන කාර්යාලය හා තොරතුරු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ගොඩනැගිල්ලේ පවත්වාගෙන යාම වෙනුවෙන් ගෙවිය යුතු රු.75,125,536ක ගොඩනැගිලි කුලිය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | මේ පිළිබඳව අධිකාරිය දැනුවත් කර ඇති අතර මේ වන තෙක් දෙපාර්ශවය අතර මූල්‍ය වටින්කම සඳහා නෛතික එකගත්වයක් ඇති වී නොමැති බැවින් ඉදිරියේදී දෙපාර්ශවයේ එකගතාව මත කටයුතු කරමි. | ගොඩනැගිලි කුලිය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු බව. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා යුධ හමුදාව වෙත පිරිවැය රු.4,594,902 ක පරිඝණක, කාර්යාල උපකරණ, ලී බඩු හා සවිකරීම් සහ විවිධ උපකරන භාර දී ඇතත් එම වටිනාකම රු.1,619,645 ක් අඩුවෙන් ගිණුම්වලින් ඉවත් කර තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | ගිණුම්කරණ අඩුපාඩුව නිවැරදි කළ යුතු බව. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු දූරකථන/ සනීපාරක්ෂක හා ආරක්ෂක ගාස්තු රු.53,531,048 ක් වුවත්, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු ශේෂය රු. 33,267,512 ක් වීමෙන් එම ශේෂයන් අතර රු. 20,263,536 ක වෙනසක් නිරීක්ෂණය විය. | වෙනස හදුනා ගැනීමට කටයුතු කරමින් පවතී. | වෙනසට හේතු සොයා බලා අදාල නිවැරදි කිරීම් කළ යුතු බව. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | තානාපති කාර්යාලවලින් ලැබිය යුතු මුදල් | 7,991,128 | උපලේඛනය හෝ ශේෂ සනාථ කිරීම් | සටහන් කර ගතිමි. | උපලේඛන හෝ ශේෂ සනාථ නොපමාව ඉදිරිපත් කළ යුතු බව. |
| (ආ) | තානාපති කාර්යාල සඳහා ලබා දුන් නොපියවූ අත්තිකාරම් | 86,214,842 | ශේෂ සනාථ කිරීම් | මෙම මුදල් නිරවුල් කිරීමට ඉදිරියේදී පියවර ගනු ලැබේ. | අදාළ ශේෂ සනාථ නොපමාව ඉදිරිපත් කළ යුතු බව. |

### 1.6 ලැබිය යුතු ගිණුම් සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාර්යාංශයෙන් රටවල් 08ක තානාපති කාර්යාල වෙත ලබාදී තිබූ රු.13,774,194 ක අත්තිකාරම් මුදල් වසරක් ඉක්මවා ඇතත් නිරවුල්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අත්තිකාරම් මුදල පියවා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. | ලැබිය යුතු ශේෂ කඩිනමින් අයකර ගත යුතු බව. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු. 277,917,521 ක් වූ ශේෂය තුළ වර්ෂ 5 කට වැඩි කාලයක සිට පැවතෙන ශේෂය රු. 3,304,920ක අයකරගෙන නොතිබුණු අතර ඒ වෙනුවෙන් සම්පූර්ණයෙන් අඩමාන ණය ප්‍රතිපාදනයන් සලසා තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකග වෙමි. | ලැබිය යුතු ශේෂ කඩිනමින් අයකර ගත යුතු බව. |

### 1.6.2 ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විවිධ ණයහිමියන් යටතේ දක්වා තිබූ රු. 53,531,048 ක ශේෂය තුළ රු.8,103,211 ක් වර්ෂ 05 කට වැඩි කාලයක්ද, රු. 2,344,090 ක් වර්ෂ 05 ට අඩු වර්ෂ 03ට වැඩිකාලයක්ද, රු.12,070,254 ක් වර්ෂ 04ට අඩු වර්ෂ 02ට වැඩි කාලයක සිට පවතින ශේෂයන්ගෙන් සමන්විත වී තිබුණි. | මෙම ශේෂය තුළ ඇතුළත් සංචාරක සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු ගොඩනැගිලි කුලී සහ 2014 වර්ෂයේ මාස 03ක් සඳහා දුරකථන ගාස්තු ශේෂය වන රු. 8,103,211ක් පිළිබඳව ඉදිරියේදී අධිකාරිය සමග සාකච්ඡා කර ඒ අනුව කටයුතු කරනු ලබන අතර රු. 14,414,343ක වටිනාකම සඳහා බිල්පත් ලැබී නොමැත. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතු බව. |

## 1.7 නීතිරීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි විය.

| නීතිරීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ VII පරිච්ඡේදයේ 40 වගන්තියේ 09 උප වගන්තිය | වගන්තිය ප්‍රකාරව සෑම ලිත් වර්ෂයක් අවසානවී මාස තුනක් ඉකුත් වීමට පෙරාතුව එම වර්ෂයේ කටයුතු පිළිබඳව ඉදිරිපත්කළ යුතු වාර්තා, ප්‍රකාශනයන් සහ සැලැසුම් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | සටහන් කර ගතිමි. | පනතේ විධි විධාන ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු වාර්තා ඉදිරිපත් කල යුතු බව. |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) මුදල් රෙගුලාසි 102 හා 104 | වටිනාකම රු. 308,700 ක් වන ලැප්ටොප් පරිගණක තුනක් අස්ථානගත වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පරිගණක උපාංග හඳුනා ගැනීමට කටයුතු කරමින් පවතින අතර තොරතුරු ඉදිරියේදී ලබා දීමට කටයුතු කරනු ලැබේ. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (ii) මුදල් රෙගුලාසි 169(2) | 2016 වර්ෂයේදී අගරු වූ වටිනාකම රු. 220,000 ක් වූ චෙක්පත් 03 ක් සම්බන්ධයෙන් මෙම රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අගරු වූ චෙක්පත් පිළිබඳව අදාල නිලධාරීන් දැනුවත් කර ඇති අතර ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. | අගරු වූ චෙක්පත් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂයට අදාලව ස්ථාවර වත්කම් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | 2018 වර්ෂයට අයත් ස්ථාවර වත්කම් සමීක්ෂණ වාර්තාව මේ වන විට අවසන් කර ඇති අතර භාණ්ඩ හදුනාගැනීම සඳහා වර්තමානයේදී කටයුතු කරමින් පවතී. | නියමිත කාල වකවානු තුළ ස්ථාවර වත්කම් සමීක්ෂණය සිදු කළ යුතු බව. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 282,382,760 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,644,798,552 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,362,415,792 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ අපගමන බදු ආදායම රු. 514,972,943 කින් හා සංචාරක සංවර්ධන බදු ආදායම රු.380,416,981කින් අඩුවීම හා වෙළඳ වියදම් රු. 448,175,159 කින් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.